# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,829 — 1961 දෙසැම්බර් 20 වැනි බදාදා — 20.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**කේඩී. 96 වෙනි අංකය දරණ ආහාර මිල නියෝගය**

**දුඹුරු සීනි සහ සුදු සීනි**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරී තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් සිරිල් ජෝසප් සේරසිංහ වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4වෙනි වගන්තිය සමග කියැවෙන 3 (2) වෙනි වගන්තියෙන් නියෝජ්‍ය ආහාර මිළ පාලක තැනට පැවරී ඇති බලතල අනුව—

(1) අංක 12,569 සහ 1961 අගෝස්තු මස 3 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත අංක. කේඩී. 93 හා 1961 ජූලි මස 28 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය මේ මොහොතේ සිට වහාම අවලංගු කරමි.

(2) මේ මොහොතේ සිට මීට යාකොට ඇති පළමුවන උපලේඛනයේ පලමුවන තීරයේ සඳහන් පෙදෙස්වල දුඹුරු සීනි තොග වශයෙන් විකිණීමේදී දල බරින් හොන්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ දෙවෙනි තීරයේ අනුපිලිවෙලින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් වහාම නියම කරමි.

(3) මේ මොහොතේ සිට මීට යාකොට ඇති දෙවෙනි උපලේඛනයේ පලමුවන තීරයේ සඳහන් පෙදෙස්වල සුදු සීනි තොග වශයෙන් විකිණීමේදී දල බර හොන්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛණයේ තුන්වන තීරයේ අනු පිලිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) මේ මොහොතේ සිට මීට යාකොට ඇති දෙවන උපලේඛනයේ පලමුවන තීරයේ සඳහන් පෙදෙස්වල දුඹුරු සීනි සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බරින් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ දෙවෙනි තීරයේ අනු පිලිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(5) මේ මොහොතේ සිට මීට යාකොට ඇති දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් පෙදෙස්වල සුදු සීනි සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බරින් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල එම උපලේඛනයේ තුන්වන තීරයේ අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් කාර්‍ය සඳහා—

(අ) දුඹුරු සීනි හෝ සුදු සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම ද දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකවර විකිණීමද තොග වශයෙන් විකිණීමක් වශයෙන් සලකනු ලබන බවත්,

(ආ) දුඹුරු සීනි හෝ සුදු සීනි පරිභෝගය පිණිස දළ බර හොන්ඩරයකට අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) හකුරු, සූකිරි, ආදිය සීනි යන්නට ඇතුලත් නැති බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.


2341—ජේ. ඇන්. ආර් 530—6,000 (12/61)

(7) එසේම මේ නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ කිසියම් ප්‍රදේශයක දුඹුරු සීනි හෝ සුදු සීනි වෙන ද්‍රව්‍යයන් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(8) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක දුඹුරු සීනි හෝ සුදු සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඒ සීනි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ සීනිවලට මේ නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට අඩුනොවූ ඉලක්කම්වලින් මිල පුවරුවක ලියා එම පුවරුව එම භාජනයට ඇඳා එම සීනිද මිළ පුවරුවද ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙයින් නියම කරමි.

(9) එසේම මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා රාත්තල හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවරදුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද මෙයින් නියම කරමි.

(10) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දුඹුරු සීනි හෝ සුදු සීනි විකුණන සියල්ලෙක්ම ඒ මිලදී ගන්නාට පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) දුඹුරු සීනි හෝ සුදු සීනි විකිණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල්;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් ඉල්ලුවහොත් එය දිය යුතු බවද මෙයින් නියම කරමි.

(11) දුඹුරු සීනි හෝ සුදු සීනි විකිණීමේදී එය යම්කිසි දෙයක බහාලනු ලැබුවේ නම් හෝ ඔතනු ලැබුවේ නම් එහි මිලත් මේ නියෝගයෙන් නියමිත මිළ ගණන් වලට ඇතුලත් බව මෙයින් නියම කරමි.

1961 දෙසැම්බර් මස 4 වෙනි දින පෙරවරු 9 ට මහනුවර කච්චේරියේදී අත්සන් කරන ලදී.

සී. ජේ. සේරසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට
ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ
නියෝජ්‍ය ආහාර මිළ පාලක.

## පළමුවන උපලේඛනය—තොග මිළ

| | පළමුවන තීරය<br>ප්‍රදේශය | දෙවන තීරය<br>දුඹුරු සීනි හොන්දරයකට නියමිත වැඩිම මිල තොග වශයෙන්<br>රු. ශ. | තුන්වන තීරය<br>සුදු සීනි හොන්දරයකට නියමිත වැඩිම මිල තොග වශයෙන්<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 61 08 | 68 28 |
| 2. | මහනුවර ගඟවට සහ නාගරික කොට්ඨාශය | 60 95 | 68 15 |
| 3. | පාතහේවාහැට ආදයම් නිලධාරි තැනගේ ගම්මුලාදෑණි කොට්ඨාශයන්ගෙන් දෙල්තොට, බව්ලාන, පට්ටිය ගම උඩගම, පට්ටියගම පල්ලේගම, පට්ටියගම, නවනැලිය යන ගම්හැර | 61 0 | 68 20 |
| 4. | පාත හේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ ඇති ගම් මුළාදෑනීන්ගේ කොට්ඨාශ වන දෙල්තොට, බව්ලාන, පට්ටියගම, පල්ලේගම, පට්ටියගම උඩගම, පට්ටියගම ගබඩාගම, නවනැලිය සහ බෝපිටිය | 61 70 | 68 20 |
| 5. | උඩපලාත ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 61 50 | 68 70 |
| 6. | හාරිස්පත්තුවේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 61 10 | 68 30 |
| 7. | තුම්පනේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 61 40 | 68 60 |
| 8. | පාතදුම්බර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 61 05 | 68 25 |
| 9. | මැදදුම්බර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 61 70 | 68 90 |
| 10. | උඩ දුම්බර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කන්දපහල් කෝරලය හැර | 62 0 | 69 20 |
| 11. | උඩ දුම්බර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කන්දපහල කෝරළය | 62 20 | 69 50 |
| 12. | උඩ බුලත්ගම ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන නාවලපිටිය, පල්ලේගම, කඩියන්ලෙන, අඹගමුව, පැනිතුඩුව සහ රඹුක්පිටිය | 62 0 | 69 20 |
| 13. | උඩ බුලත්ගම ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ ගම් මූලාදෑනි කොට්ඨාශ වන උතුරු යටිගන්හුලහ, දකුණු යටිගන්හුලහ, හැටන්, දික්ඔය සහ අක්කරවත්ත. | 62 0 | 69 20 |
| 14. | උඩ බුලත්ගම ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ බොගවන්තලාව, මොරහේනේගම, නෝර්වුඩ්, මස්කෙලිය, පොල්පිටිය, කඩවල, හෝමාගම, වැලිගම්පොල, මාපාකන්ද, කිරිවන්එළිය සහ හහරාපිටිය | 63 30 | 70 50 |
| 15. | (අ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ ගඟපලාත කෝරළයේ මල්උල්ල වසම සහ උඩගම වසමේ මුදුනපිට කඩවීදිය | 61 70 | 68 90 |
| | (ආ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ දියතිලක කෝරලේ සහ කොහක කෝරලේ | 61 70 | 68 90 |
| | (ඇ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ ගන්නෑව කෝරලයේ ගම්මුලාදෑනි කොට්ඨාශ වන ඇකිරිය සහ වේගම | 61 70 | 68 90 |
| 16. | නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයෙහි 15 (අ), 15 (ආ), 15 (ඇ) යන අංකයන්හි නම්කර නැති ප්‍රදේශ | 62 25 | 69 45 |

## දෙවෙනි උපලේඛනය—සිල්ලර මිළ

| පලමුවන තීරය<br>ප්‍රදේශය | දෙවන තීරය<br>දුඹුරු සිනි ශුද්ධ රාත්තලකට නියමිත වැඩිම මිළ<br>රු. ශ. | තුන්වන තීරය<br>සුදු සිනි ශුද්ධ රාත්තලකට නියමිත වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. ගමවට කෝරලය සහ මහනුවර නගර සභා කොට්ඨාශය | 0 57 | 0 64 |
| 2. ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශ වූ— | | |
| (අ) උඩුනුවර සහ යටිනුවර | 0 59 | 0 66 |
| (ආ) පාතහේවාහැට | 0 59 | 0 66 |
| (ඇ) උඩපලාත | 0 59 | 0 66 |
| (ඈ) හාරිස්පත්තුව | 0 59 | 0 66 |
| (ඉ) තුම්පනේ | 0 59 | 0 66 |
| (ඊ) පාතදුම්බර | 0 59 | 0 66 |
| (උ) මැදදුම්බර | 0 59 | 0 66 |
| (ඌ) උඩදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කන්ද පහළ කෝරලය හැර | 0 59 | 0 66 |
| 3. උඩදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කන්ද පහල කෝරලය | 0 60 | 0 67 |
| 4. (අ) උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශ වන නාවලපිටිය, පල්ලේගම, කඩියන් ලෙන, අඹගමුව, පැනිතුඩුව සහ රඹුක්පිටිය | 0 59 | 0 66 |
| (ආ) උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයෙහි අනිත් ප්‍රදේශ | 0 60 | 0 67 |
| 5. නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 0 59 | 0 66 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැක.

12—1139

---

අංක ජේ/36/61 දරණ ආහාර මිළ නියෝගය — සකස් කළ සුදු සිනි

## 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

යාපනය දිසාවේ සහකාර මිළ (ආහාර) පාලක තැන වූ කන්දයියා සිවප්‍රගාසම් වන මට, 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් ලැබී ඇති බලතල අනුව, මෙම නියෝගයෙන් :—

(1) 1961 ක්වූ අගෝස්තු මස 2 වන දින හා අංක 12,568 දරණ රජයේ ගැසට් පතෙහි පළ කරන ලද 1961 ක්වූ ජූලි මස 28 වන දින හා අංක ජේ/29/61 දරණ මගේ ආහාර මිළ නියෝගය මෙවක් පටන් අවලංගු කරමි.

(2) මෙයට යා කොටැති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ප්‍රදේශයන්හි තොග වෙළෙන්දෙකු විසින් සකස් කළ සුදු සිනි දළබර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ මෙකී උපලේඛනයේ දෙවන තීරයේද, එකී ප්‍රදේශයන්හි සිල්ලර වෙළෙන්දකු විසින් සකස් කළ සුදු සිනි ශුද්ධ බර රාත්තලක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ මෙම උප ලේඛනයේ තුන්වන තීරයේද සඳහන් කරති මිළ යයි මෙයින් නියම කරමි.

(3) මෙම නියෝගයෙහි කාර්‍ය සඳහා :—

(අ) සකස් කළ සුදු සිනි වරකට හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් බවටත්,

(ආ) එකී ද්‍රව්‍ය පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ හොන්ඩරයකට වඩා අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලරට විකිණීමක් බවටත්,

(ඇ) සිනි වලට කිසිම හකුරු වර්ගයක් ඇතුළත් නොවිය යුතු බවටත් මෙයින් නියම කරමි.

(4) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, සිනි වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතුයි.

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක සකස් කළ සුදු සිනි සිය ස්වාමිත්වයේ හෝ පාලනයේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එම සිනි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා මෙම නියෝගයෙහි නියම කරන වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක ලියා එම පුවරුව එම භාජනය අසලම සෑම ගනුදෙනු කාර යෙකුටම පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ එකී වාහනයේ තැබිය යුතුයි.

(6) මෙම නියෝගයෙහි කාර්‍ය සඳහා රාත්තල යනුවෙන් හැඳින්වෙනුයේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තල වේ.

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරන ලද ප්‍රදේශයන්හි සකස් කළ සුදු සිනි විකිණීමේදී ඒවා මිළදී ගන්නාට පහත සඳහන් විස්තර ඇතුළත් කුවිතාන්සියක්, ඉල්ලුවහොත් දිය යුතුයි :—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ ප්‍රමාණය— බර අනුව,

(ඇ) ඒ සඳහා ගෙවූ මුදල,

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන බව.

(8) තවද, මෙකී සකස් කළ සුදු සිනි යම්කිසි දෙයක බහා දෙන්නේ නම් නැතහොත් ඔතා දෙන්නේ නම්, එහි මිළත් මෙම නියෝගයෙහි සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන්නේය.

1961 ක්වූ දෙසැම්බර් මස 4 වන දින පෙරවරු 9 ට යාපනය කච්චේරියේදී අත්සන් තබන ලදී.

කේ. සිවප්‍රගාසම්,
යාපනය දිසාවේ සහකාර මිළ පාලක තැන.

## උපලේඛනය

| පළමුවන තීරය<br>ප්‍රදේශය | දෙවන තීරය<br>තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | තුන්වන තීරය<br>සිල්ලරට විකිණීමේ දී ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. යාපනය ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශය ... ... | 67 80 ... | 0 65 |
| 2. වඩමරාඩ්චි ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... ... | 68 50 ... | 0 65 |
| 3. වළිකාමම් බටහිර ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... | 69 00 ... | 0 65 |
| 4. ඩෙල්ෆ්ට් ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... ... | 69 72 ... | 0 65 |
| 5. වලිකාමම් උතුර ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... | 68 75 ... | 0 65 |
| 6. තෙන්මරාඩ්චි ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... ... | 67 95 ... | 0 65 |
| 7. පච්චිලාපලෙයි ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... ... | 68 35 ... | 0 65 |
| 8. කරාච්චි-කුනුකායි ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... | 69 44 ... | 0 65 |
| 9. වළිකාමම් නැගෙනහිර ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... | 69 00 ... | 0 65 |
| 10. දූපත් ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... ... | 68 75 ... | 0 65 |
| 11. පූනකරි ප්‍රා. ආ. නි. කොට්ඨාශය ... ... ... | 68 20 ... | 0 65 |

සැළකිය යුතුයි.—ඉහත සඳහන් මිළ ගණන් එකී ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොව, ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුයි.

12–1153

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.